සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE
අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)

11 ශ්‍රේණිය | ඉතිහාසය - I | කාලය පැය 01 යි

නම / විභාග අංකය ..............................................................................................................

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට 1,2,3,4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ සටහන් කරන්න.

01. පුරාණ කාලයට අයත් සාහිත්‍ය, ආගමික තොරතුරු හා වංශකතා ලියවී ඇති මූලාශ්‍රය වන්නේ.
1. සෙල්ලිපි  2. තඹපත්  3. පුස්කොළ පොත්  4. රන් පත්

02. ඓතිහාසික පුවත් කෙටියෙන් දැක්වීම, මෙරට පැරණිතම වංසකතාව වීම හා ක්‍රි.ව. හතර වන සියවසේ දී රචනා කිරීම යන කරුණු අදාල වන්නේ,
1. මහාවංසය  2. පූජාවලිය  3. ථූපවංසය  4. දීපවංසය

03. පහත දක්වෙන විදේශිකයන් අතරින් මෙරටට නොපැමිණ තොරතුරු අධ්‍යයනය කොට වාර්තා සකස් කල අය ඇතුලත් පිළිතුර කුමක් ද?
A - ඇරිස්ටෝටල්  B - ඉබන් බතූතා  C - ප්ලිනි
D - ටොලමි  E - පාහියන් හිමි  F - රොබට් නොක්ස්
1. A,C හා D  2. A,B හා E  3. B,E හා F  4. C,D හා E

04. කිතුල්ගල බෙලිලෙන හා කුරුවිට බටදොඹලෙන වැදගත් වන්නේ ඒවා,
1. බෞද්ධ භික්ෂූන්වහන්සේලා වැඩ වාසය කල නිසා ය.
2. ප්‍රාග් ඓතිහාසික මානවයා පිළිබඳ සාක්ෂි හමුවීම නිසා ය.
3. කටාරම් අසල ලෙන් ලිපි දකගත හැකි නිසා ය.
4. දෙවන නාගරීකරණ අවධියට අයත් වන නිසා ය.

05. ශ්‍රී ලංකාවේ පැරණි වෙළඳ වරායන් පමණක් ඇතුළත් වන පිළිතුර වන්නේ,
1. සල්වතොට, කඳුරුගොඩ, දේවනගර  2. ඌරාතොට, රංචාමඩම, මහාතිත්ථ
3. ගෝකණ්ණතිත්ථ, සූකරතිත්ථ, ගොඩවාය  4. මහාතිත්ථ, බූන්දල, සල්වතොට

06. පහත දක්වෙන X තීරුවේ මෙරට සිටි රජවරු කිප දෙනෙකු ද Y තීරුවේ එම රජවරු සම්බන්ධ සිදුවීම් ද දක්වේ. X හා Y තීරු නිවැරදිව ගලපන්න.

| X තීරුව | Y තීරුව |
|---|---|
| 1. මහසෙන් රජතුමා | A - කාලිංග කුමාරිකාවක් විවාහ කරගැනීම |
| 2. වසභ රජතුමා | B - ජේතවන දාගැබ ඉදිකරවීම |
| 3. මහා විජයබාහු රජතුමා | C - බෙලිගල දළදා මැදුර ඉදිකරවීම |
| 4. තුන්වන විජයබාහු රජතුමා | D - මහ වැව් තැනවීමේ පුරෝගාමියා වීම |

1. B D A C  2. C D A B  3. A C B D  4. D C A B



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers  Model Answers - Study Resources

07. අතීතයේ වරාය ආශ්‍රිතව තිබූ ගම් හඳුන්වන ලද්දේ,

1. ඕලගම්     2. නියම්ගම්     3. පට්ටනගාම     4. ඛේවට්ටගාම

08. පූර්ව ඓතිහාසික යුගයේ සුසාන චාරිත්‍රයක් වන මැටි ඔරු සුසාන මුලින්ම හමු වී ඇති ප්‍රදේශය වන්නේ,

1. ගල්සොහොන් කනත්ත     2. රංචාමඩම     3. බෙරගල     4. ඉබ්බන්කටුව

09. මහා පරාක්‍රමබාහු රජතුමා ගේ උත්පත්තිය සිහිවීමට ඉදිකර වූ දාගැබ වූයේ,

1. රන්කොත්වෙහෙර     2. ථූපාරාමය     3. කිරිවෙහෙර     4. සූතිඝර චෛත්‍යය

10. පහතින් දැක්වෙන X හා Y තීරු අතර සබඳතාව දක්වන වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

| X තීරුව | Y තීරුව |
|---|---|
| 1. ගෝවින්දමලය | A - සුභ සෙනෙවි |
| 2. දඹදෙණිය | B - සංඛ සෙනෙවි |
| 3. ගංදෙණිය | C - තුන්වන විජයබාහු |
| 4. යාපහුව | D - බුවනෙකබාහු ආදිපාද |

1. C A D B     2. B C D A     3. D B C A     4. D C B A

11. වර්ෂ 1505 දී පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට කෝට්ටේ රාජධානියේ රාජ්‍ය පාලකයා වූයේ,

1. හයවන විජයබාහු රජු     2. අටවන වීර පරාක්‍රමබාහු රජු
3. හයවන පරාක්‍රමබාහු රජු     4. හයවන බුවනෙකබාහු රජු

12. පහත සඳහන් කරුණු හා සම්බන්ධ පිළිතුර තෝරන්න.

- දන්තුරේ සටනින් පෘතුගීසීන් අන්ත පරාජයට පත් කිරීම
- නව රාජවංශයක ආරම්භකයා වීම
- බුරුම දේශයෙන් උපසම්පදාව ගෙන ඒම

1. පළමුවන විමලධර්මසූරිය රජු     2. සේනාසම්මත වික්‍රමබාහු රජු
3. දෙවන විමලධර්මසූරිය රජු     4. සෙනරත් රජු

13. අතීතයේ 'හවජර' නමින් හැඳින්වූයේ,

1. දුර මැනීමේ ඒකකයකි.     2. බර මැනීමේ ඒකකයකි
3. කාලය මැනීමේ ඒකකයකි     4. අවකාශය මැනීමේ ඒකකයකි

14. පළමු නාගරීකරණයේ අවසාන රාජධානිය වූ පොළොන්නරුව බිඳවැටීමට බලපෑ ආසන්නතම හේතුව වූයේ,

1. දුර්වල පාලකයන් බලයට පත්වීම     2. ආර්ථික පරිහානිය
3. රාජ්‍යත්වයට ඇති වූ බල අරගලය     4. කාලිංග මාඝ ගේ ආක්‍රමණය

15. "අ" තීරුවේ දක්වෙන ඓතිහාසික සිදුවීම් "ආ" තීරුවේ රාජධානි සමග ගැලපූ විට පිළිතුර තෝරන්න.

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| 1. පාණ්ඩ්‍ය හමුදාව දළදාව පැහැර ගැනීම | A - කෝට්ටේ |
| 2. පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම. | B - කුරුණෑගල |
| 3. චෙන් හෝ සෙනෙවියාගේ ආක්‍රමණය | C - යාපහුව |
| 4. සපුමල් කුමරු යාපාපටුන ජයගැනීම | D - ගම්පොළ |

1. D A C B     2. C B D A     3. C D B A     4. A C D B

16. මහනුවර රාජධානියේ බද්දේ සංවිධානය යටතේ පැවති "මඩිගෙ බද්ද" ට අයත් කාර්යය වූයේ,

1. ඇතුන් ඇල්ලීම     2. වළං සෑදීම     3. ප්‍රවාහන කටයුතු     4. රෙදි විවීම



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

17. පුනරුද සමයේ එංගලන්තයේ සිටි ගත් කතුවරයෙකු නොවූයේ,

1. පෙට්රාක් 2. තෝමස් මුවර් 3. ප්‍රැන්සිස් බේකන් 4. විලියම් ෂේක්ස්පියර්

18. වර්ෂ 1521 විජයබා කොල්ලය නිසා බිහි නොවූ රාජධානිය වූයේ,

1. රයිගම 2. කෝට්ටේ 3. සීතාවක 4. යාපනුව

19. පෙරදිග පෘතුගීසි මූලස්ථානය වූයේ,

1. බතාවිය 2. ගෝව 3. මදුරාසිය 4. කරිකාල්

20. පහතින් දක්වා ඇති රාජ්‍ය පාලකයන් අතුරෙන් පෘතුගීසි විරෝධී ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කල පාලකයන් අයත් පිළිතුර තෝරන්න.

A - විජය කුලංකෛ B - සංකිලි C - රාජාධිරාජසිංහ

D - I විමලධර්මසූරිය E - එදිරිමාන්නසිංහම් F - දෙවන රාජසිංහ

1. DEF 2. CEF 3. BDF 4. ACF

21. කාර්මික විප්ලවයේ සෘජු බලපෑමට ශ්‍රී ලංකාව නතු වූ ප්‍රධාන සාධකය ලෙස දැක්විය හැක්කේ,

1. කෝපි මෝලක් ඇරඹීම 2. බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වීම

3. වැවිලි භෝග ඇරඹීම 4. ඉන්දියානු කම්කරුවන්ගේ පැමිණීම

22. පහත සඳහන් X හා Y තීරු නිවැරදිව ගැලපූ විට පිළිතුර තෝරන්න.

| X තීරුව | Y තීරුව |
|---|---|
| 1. විලියම් සිමන්ස් | A - ජල රාමුව |
| 2. රිචඩ් ආක්රයිට් | B - වාෂ්ප එන්ජිම |
| 3. ඩේම්ලර් | C - රූපවාහිනිය |
| 4. ජෝන් ලෝගීබෙයාර්ඩ් | D - යපස් උණු කිරීමේ විදුලි උදුන |
| | E - මෝටර් රථය |

1. DAEC 2. BAEC 3. ADBC 4. CBEA

23. වර්ෂ 1815 ඓතිහාසික උඩරට ගිවිසුම අත්සන් කිරීමෙන් පසු,

1. උඩරට ඉංග්‍රීසීන්ට යටත් විය 2. වෙරළබඩ ප්‍රදේශ ඉංග්‍රීසීන්ට යටත් විය

3. ද්විත්ව පාලනය ඇති විය 4. ලංකාව ඉංග්‍රීසින්ගේ යටත් විජිතයක් විය

24. වර්ෂ 1818 ප්‍රථම නිදහස් සටනේ නායකයෙකු නොවූයේ,

1. මොණරවිල කැප්පෙටිපොළ 2. මඩුගල්ලේ දිසාව

3. ගොංගාලේගොඩ බණ්ඩා 4. බුටැවේ රටේ රාළ

25. අනගාරික ධර්මපාල තුමා ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා කිරීමට පිහිටුවා ගන්නා ලද්දේ,

1. ලංකා සංගමය 2. මහාබෝධි සමාගම

3. පරම විඥානාර්ථ සමාගම 4. බෞද්ධ උරුම රැක ගැනීමේ සංගමය

26. කෝපිවලට අය කළ අපනයන බද්ද අඩු කර එම වගාවේ උන්නතියට ක්‍රියාකළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වූයේ,

1. එඩ්වඩ් බාන්ස් 2. හෙන්රි වෝඩ් 3. හියු මේසන් 4. ආතර් ගෝඩන්

27. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමය තුල දේශීය යැපුම් කෘෂිකර්මයේ පරිහානියටත්, වතු බෝග වගාවේ උන්නතියටත් බලපෑ කරුණ වන්නේ,

1. ඉංග්‍රීසි අධ්‍යාපනය දියුණු කිරීම 2. ඉන්දියානු කම්කරුවන් මෙරටට ගෙන ඒම

3. මුඩුබිම් පනත සම්මත කිරීම 4. රාජකාරි ක්‍රමය අහෝසි කිරීම



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

28. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩ වූ විටක් පැමිණිලි කල යුත්තේ,

1. මහාධිකරණයට ය
2. ශ්‍රේෂ්ඨාධිකරණයට ය
3. දිසා අධිකරණයට ය
4. අභියාචනාධිකරණයට ය

පහත A, B, C හා D යටතේ දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවන හා දෙවන අදහස් අතර සම්බන්ධතාවය පරීක්ෂාකර බලා අංක 29 සිට 32 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. බොස්ටන් තේ සාදය
2. ඇමරිකන් නිදහස් සටන

B - 1. ප්‍රංශ විප්ලවය
2. වෙනිස් පිටියේ දිවුරුම

C - 1. ජාතීන් ගේ සංගමය
2. දෙවන ලෝක මහා සංග්‍රාමය

D - 1. රුසියන් විප්ලවය
2. සාර් පාලනය

29. දෙවැන්නේ ආරම්භයට පළමුවැන්න සෘජු ලෙස බලපෑ යුගලය,

1. D
2. C
3. A
4. B

30. පළමුවැන්න නිසා දෙවැන්න බිඳ වැටීමට බලපෑ යුගලය,

1. C
2. A
3. B
4. D

31. පළමුවැන්න ඇති වීමට දෙවැන්න අඩිටනක් වූ යුගලය,

1. B
2. A
3. D
4. C

32. පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවක් නොදක්වෙන යුගලය,

1. D
2. C
3. B
4. A

33. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ මෙරට ප්‍රථම අගමැතිවරයා වූයේ

1. ඩඩ්ලි සේනානායක මහතා.
2. ජෝන් කොතලාවල මහතා.
3. ඩී.එස්. සේනානායක මහතා.
4. ඩී.බී. විජේතුංග මහතා.

34. ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන අවස්ථාවක් වන්නේ,

1. සමානුපාතික නියෝජන ක්‍රමය
2. ජනමත විචාරණය
3. පාර්ලිමේන්තු මැතිවරණය
4. පාර්ලිමේන්තු වාද විවාද පැවැත්වීම

35. පහත A සිට D දක්වා දී ඇති ප්‍රකාශ ඇසුරෙන් පොන්නම්බලම් රාමනාදන් මහතා පිළිබඳ නිවැරදි තොරතුරු ඇතුලත් පිළිතුර කුමක් ද?

A - දෙමළ සාහිත්‍ය ග්‍රන්ථ රචනා කිරීම
B - ව්‍යවස්ථාදායකයට සීමිත ඡන්ද බලයෙන් ප්‍රථම වරට තේරී පත්වීම
C - යාපනය හින්දු විද්‍යාලයේ විදුහල්පතිවරයා ලෙස පත්වීම
D - වර්ෂ 1915 සිංහල මුස්ලිම් කෝලාහලයේ දී බෞද්ධයන් වෙනුවෙන් පෙනී සිටීම

1. A හා C
2. B හා C
3. A හා D
4. B හා D

36. අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කරන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක් ද?

1. කෝල්බෲක්
2. සෝල්බරි
3. මැනිං
4. කෲව් මැකලම්

37. මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ පළමු අදියර ලෙස හැඳින්විය හැක්කේ,

1. වික්ටෝරියා ජලාශය
2. මොරගහකන්ද ජලාශය
3. පොල්ගොල්ල අමුණ
4. මාදුරුඔය ජලාශය



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

38. එක්සත් ජර්මනිය බිහිකිරීමේ පුරෝගාමියා වූයේ,

1. වොන් වෝල්ක් ය.
2. ඔටෝ වොන් බිස්මාර්ක් ය.
3. දෙවන විලියම් රජු ය.
4. ඇඩොල්ෆ් හිට්ලර් ය.

39. පළමුවන ලෝක යුද්ධයට තුඩු දුන් ආසන්නතම හේතුව වූයේ,

1. යටත් විජිත සඳහා වූ තරඟය
2. අවි තරඟය හා ජාතිවාදය වර්ධනය වීම
3. සරයේවෝ සිද්ධිය
4. ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ දී ප්‍රංශය හා ජර්මනිය සතුරන් බවට පත්වීම.

40. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජික රටක් නොවන්නේ,

1. බ්‍රිතාන්‍ය
2. චීනය
3. ප්‍රංශය
4. ඉන්දියාව



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

01. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) ගෝකණ්ණතිත්ථ, මල්වතු ඔය, කදුරුගොඩ, පාහියන්ගල, ගම්පොළ, කලාවැව, පොළොන්නරුව, මහාවාලුකාගාම, හුරුළු වැව, මඩකලපුව, රංචාමඩම, කප්පකන්දර නදිය (ල. 12)

(ii) මලය අර්ධද්වීපය, බොම්බාය, ඉතාලිය, සුබපැතීමේ තුඩුව, ස්පාඤ්ඤය, ජාවා දූපත (ල. 06)

(ආ) i. පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාල පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - බුදු දහම මෙරටට රැගෙන එන විට මෙරට රාජ්‍ය පාලකයා —


B - පූර්ව ඓතිහාසික යුගයට අයත් නේවාසික ස්ථානයක සාක්ෂි හමු වූ ප්‍රදේශය —

C - වර්ෂ 1840 දී එංගලන්තයේ ආරම්භ වූ නව තැපැල් සේවාව —

D - දේශගවේෂණ කටයුතු සඳහා අනුග්‍රහය ලබාදුන් පෘතුගාල කුමාරයා — (ල. 04)

A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A



(i.) 1. A රූපයෙන් දැක්වෙන උපකරණය කුමක් ද?
2. මෙ මගින් කෙරෙන කාර්යය කුමක් ද?
3. මෙම උපකරණය නිපද වූයේ කවුරුන් ද?
4. මෙතුමා හඳුන්වන අන්වර්ථ නාමය කුමක් ද? (ල. 04)

B



(ii.) 1. B රූපයෙන් දැක්වෙන්නේ කවුරුන් ද?
2. මෙතුමා කිනම් රටක සිට පැමිණියේ ද?
3. මෙතුමා ආරම්භ කල සංගමය කුමක් ද?
4. මොහු විසින් ආරම්භ කල බෞද්ධ පාසලක් සඳහන් කරන්න. (ල. 04)

## II කොටස

02. (i.) පහත සඳහන් කරුණ හා සම්බන්ධ කෙටි යෙදුම සඳහන් කරන්න.

A - ගල්ලෙන්වල කටාරම අසල ලියූ ලිපි —

B - සකස් කරගත් ගල් කුලුනු මත ලියූ ලිපි —

C - සකස් කරගත් ගල් පුවරු මත ලියූ ලිපි — (ල. 03)

(ii.) ප්‍රාග් ඓතිහාසික යුගයේ පැවති අභිචාර විධි දෙකක් සඳහන් කරන්න. (ල. 04)

(iii.) ප්‍රාග් ඓතිහාසික යුගයේ විසූ මානවයාගේ ආහාර රටාව පිළිබඳ කරුණු දෙකකින් විස්තර කරන්න. (ල. 05)

(iv.) ගල් යුගය තුළින් පූර්ව ඓතිහාසික යුගයට පරිවර්තනය වීමේ දී දැකිය හැකි වූ විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 06)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

03. (i.) පහතින් දක්වෙන මෙරට පැරණි වරායන් වර්තමානයේ හඳුන්වන නාම සඳහන් කරන්න.

A - දේවනගර B - සල්වතොට C - ගෝකණ්ණ (ල. 03)

(ii.) පහතින් සඳහන් කර ඇති A, B, C හා D වලින් දක්වෙන කරුණු හා සම්බන්ධ යෙදුම වරහන තුළින් තෝරා ලියන්න. (දුනු අචරිය, දකපති, ව්‍යවස්ථාදායකය, බොජකපති, අන්තේවාසික, විධායකය, අස අචරිය, සදිවිහරිය)

A - රටක නීති සම්පාදනය කරන ආයතනය —

B - නායක තෙරුන් වහන්සේලා සමීපයේ සිටි ශිෂ්‍යය භික්ෂූන් වහන්සේලා —

C - දුනු ශිල්පය ඉගැන් වූ ගුරුවරු —

D - රජුට අයත් ඉඩම්වල වගා කිරීම වෙනුවෙන් ගෙවන ලද බද්ද — (ල. 04)

(iii.) මෙරට ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ නරපතියෙකු වන මහා විජයබාහු රජතුමාගේ සේවාව විස්තර කරන්න. (ල. 05)

(iv.) අතීතයේ සිට ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර වෙළඳාම දියුණු තත්වයක පැවති බව කරුණු දෙකකින් විස්තර කරන්න. (ල. 06)

04. (i.) පහත සඳහන් කරුණට අදාල පිළිතුර ලියන්න.

A - යාපනුවේ පළමුවන භුවනෙකබාහු රජු වෙළඳ සබඳතා පැවැත් වූ විදේශ රට

B - සීතාවක රාජසිංහ රජු පෘතුගීසින් පරාජයට පත්කල ඓතිහාසික සටන

C - වර්ෂ 1602 දී මෙරටට පැමිණි ප්‍රථම ලන්දේසි දූතයා (ල. 03)

(ii.) උඩරට රජතුමා විසින්ම විසඳන ලද නඩු වර්ග හතරක් ලියන්න. (ල. 04)

(iii.) පුරාණ ලාංකිකයන්ගේ විශිෂ්ට තාක්ෂණික නිර්මාණයක් වන වැවක ප්‍රධාන අංග දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(iv.) මහනුවර රාජධානියේ පැවති ආර්ථික ක්‍රමය කරුණු දෙකකින් විස්තර කරන්න. (ල. 06)

05. (i.) ඉංග්‍රීසීන් මෙරට මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගැනීමට පෙර උඩරටට පැමිණි ඉංග්‍රීසි දූතයින් තිදෙනා නම් කරන්න. (ල. 03)

(ii.) පහත සඳහන් A, B, C හා D ට අදාල පිළිතුරු වරහන තුළින් තෝරා ලියන්න.

(මීගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, සාජහාන්, ෆෙඩ්රික් නෝර්ත්, රොබට් බ්‍රවුන්රිග්, හජ්ජි මරික්කාර්, ජහාන්ගීර්, වාරියපොළ සුමංගල හිමි)

A - ඉංග්‍රීසින් ඉන්දියාවට පැමිණෙන විට සිටි මුගල් අධිරාජයා —

B - උඩරට මඩිගෙ මුහන්දිරම් තනතුරට පත් වූ මුස්ලිම් ජාතිකයා —

C - මිෂනාරීන් සමඟ වාද විවාද පැවැත්වීමට නායකත්වය දුන් බෞද්ධ භික්ෂූන් වහන්සේ —

D - මුහුදුබඩ ප්‍රදේශවලට පත් වූ ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා — (ල. 04)

(iii.) A - වර්ෂ 1848 දෙවන නිදහස් සටනේ නායකයින් දෙදෙනෙකු නම් කරන්න.

B - වර්ෂ 1848 දෙවන නිදහස් සටනට තුඩුදුන් හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(iv.) A - ආරුමුග නාවලර් තුමා හින්දු ආගමික පුනරුදය සඳහා සිදුකල සේවාට කෙටියෙන් විස්තර කරන්න.

B - එම්.සී. සිද්දි ලෙබ්බෙ මහතා ඉස්ලාම් ආගමික පුනරුදය සඳහා සිදුකල සේවාව කෙටයෙන් විස්තර කරන්න. (ල. 06)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources

06. (i.) පහත සඳහන් දේශපාලන පක්ෂ වල ආරම්භක නායකයින් නම් කරන්න.

A - එක්සත් ජාතික පක්ෂය —

B - කම්කරු පක්ෂය —

C - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය — (ල. 03)

(ii.) පහත සඳහන් A, B, C හා D යන කරුණට අදාල පිළිතුරු වරහන තුලින් තෝරා ලියන්න.

(පොන්නම්බලම් රාමනාදන්, ජේම්ස් ටේලර්, ජේම්ස් පීරිස්, පියදාස සිරිසේන, පොන්නම්බලම් අරුණාචලම්, ජෝර්ජ් බර්ඩ්, වලිසිංහ හරිස්චන්ද්‍ර, ඩී.බී. ජයතිලක) —

A - ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා —

B - අනුරාධපුරයේ පූජනීය ස්ථාන ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපාරයේ පුරෝගාමී නායකයා —

C - ශ්‍රී ලංකාවට තේ වගාව හඳුන්වා දුන් ඉංග්‍රීසි ජාතිකයා —

D - ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය බවට විධිමත් පෙත්සමක් මුල්වරට ඉදිරිපත් කල ප්‍රභූවරයා — (ල. 04)

(iii.) වර්ෂ 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණයේ වැදගත් ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(iv.) ශ්‍රී ලංකාවේ වසර 150 ක් පුරා පැවති බ්‍රිතාන්‍ය පාලනය නිසා උරුම වූ ප්‍රයෝජනවත් අංග දෙකක් විස්තර කරන්න. (ල. 06)

07. (i.) සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන අංග තුනක් නම් කරන්න.

(ii.) පහතින් දක්වා ඇති A, B, C හා D ට අයත් කරුණු වලට සම්බන්ධ පිළිතුර පිළිවෙලින් සඳහන් කරන්න.

A - ශ්‍රී ලංකාවේ ප්‍රථම බහු කාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය —

B - ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා —

C - මෙරට ප්‍රථම වතු කම්කරු වෘත්තීය සංගම් නායකයා —

D - මෙරට 'නිදහස් අධ්‍යාපනයේ පියා' ලෙස හඳුන්වන විද්වතාණන් — (ල. 04)

(iii.) වියළි කලාපය තුළ ගොවි ජනපද පිහිටුවීමේ අරමුණු තුනක් හඳුන්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(iv.) වර්ෂ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන අංග දෙකක් විස්තර කරන්න. (ල. 06)

## III කොටස

08. (i.) පහත සඳහන් කරුණ හා සම්බන්ධ ලෝක විප්ලවය සඳහන් කරන්න.

A - "නියෝජනයක් නැත්නම් බදුත් නැත"

B - බැස්ටීල් බන්ධනාගාරයට පහර දීම

C - "මේ අවස්ථාවේ අපි බලය අල්ලා නොගතහොත් ඉතිහාසය අපට සමාව නොදෙනු ඇත" (ල. 03)

(ii.) පහත සඳහන් A, B, C හා D ට අදාල කරුණ හා සම්බන්ධ පිළිතුර වරහන තුලින් තෝරා ලියන්න.

A - ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රථම ජනාධිපති —

B - "මා අපේක්ෂා කරන ඕනෑම දෙයක් නීත්‍යානුකූලයි" —

C - දහසය වන ලුවී රජුගේ අති සුඛෝපභෝගී මාලිගය —

D - සමාජවාදී දර්ශනය පිලිගත් රටකි —

(රුසියාව, ඒබ්‍රහම් ලින්කන්, දාහතර වන ලුවී, ඇමරිකා එක්සත් ජනපදය, වර්සෙල්ස්, බැකිංහැම්, ජෝර්ජ් වොෂින්ටන්, නැපෝලියන් බොනපාට්) (ල. 04)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(iii.) ප්‍රංශ විප්ලවයට බලපෑ ආර්ථික හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(iv.) වර්ෂ 1917 රුසියාවේ ඔක්තෝම්බර් විප්ලවයේ දේශපාලන හා ආර්ථික ප්‍රතිඵල දෙකක් විස්තර කරන්න. (ල. 06)

09. (i.) එක්සත් ජාතීන්ගේ සංවිධානය ආරම්භ කිරීමට මූලික වූ රාජ්‍ය නායකයින් තිදෙනා නම් කරන්න. (ල. 03)

(ii.) පළමුවන ලෝක මහා සංග්‍රාමයට සම්බන්ධ මිත්‍ර පිලේ රටවල් දෙකක් හා මධ්‍ය බලවතුන්ගේ පිලට අයත් රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii.) වර්තමාන ලෝක සාමය රැකීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගතහැකි ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv.) දෙවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵල දෙකක් විස්තර කරන්න. (ලකුණු 06)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources


## පිළිතුරු පත්‍රය
## ඉතිහාසය I - 11 ශ්‍රේණිය

| | | | |
|---|---|---|---|
| 1. 3 | 11. 2 | 21. 2 | 31. 1 |
| 2. 4 | 12. 1 | 22. 1 | 32. 2 |
| 3. 1 | 13. 3 | 23. 4 | 33. 3 |
| 4. 2 | 14. 4 | 24. 3 | 34. 2 |
| 5. 3 | 15. 2 | 25. 2 | 35. 4 |
| 6. 1 | 16. 3 | 26. 1 | 36. 1 |
| 7. 3 | 17. 1 | 27. 3 | 37. 3 |
| 8. 2 | 18. 4 | 28. 2 | 38. 2 |
| 9. 4 | 19. 2 | 29. 3 | 39. 3 |
| 10. 4 | 20. 3 | 30. 4 | 40. 4 |

## ඉතිහාසය II - 11 ශ්‍රේණිය

### I කොටස


1. (අ) i.






www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(ආ) ii.






www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(ආ) i.A - දේවානම්පියතිස්ස/ දෙවනපිය/ දෙවනපෑතිස්
B - උඩරංචාමඩම
C - පෙනී තැපැල් සේවය
D - හෙන්රි කුමරු/ නාවික හෙන්රි (ල. 1 x 4)

ii. 1. දුරේක්ෂය/ දුරදක්නය
2. අභ්‍යාවකාශය නිරීක්ෂණය
3. ගැලීලියෝ ගැලිලි
4. අත්හදා බැලීමේ පියා (ල. 1 x 4)

iii.1. හෙන්රි ස්ටීල් ඕල්කට්/ ඕල්කට්
2. ඇමරිකා එක්සත් ජනපදය/ ඇමරිකාව
3. පරම විඥානාර්ථ සමාගම
4. කොළඹ ආනන්ද/මහනුවර ධර්මරාජ/ගාල්ල මහින්ද..... (ල. 1 x 4)

## II කොටස

2. i. A - ලෙන් ලිපි B - ටැම් ලිපි C - පුවරු ලිපි (ල. 1 x 3)
ii. රාවණාඇල්ල ලෙන/පාහියන්ගල/බටදොඹලෙන අභිචාර විධික්‍රමය සඳහන් කිරීම (ල. 2 x 2)
iii.* සතුන් දඩයම් කිරීම * ශාබමය ආහාර * මිරිදිය මසුන්/ගොලුබෙල්ලන්/ කලපු බෙල්ලන් විස්තර කිරීම (ලකුණු 5 න් ලබා දීම)
iv.* පිළිස්සූ මැටි වළං භාවිතය * ක්‍රමවත් සුසාන චාරිත්‍ර * යකඩ භාවිතය * ස්ථිර නිවාස * කෘෂිකර්මය ඇරඹීම. (ලක්ෂණ තුනට ල. 03 යි. විස්තරයට ල. 03 යි.)

3. i. A - දෙවුන්දර/දෙවිනුවර B - හලාවත C - ත්‍රිකුණාමලය (ල. 1 x 3)
ii. A - ව්‍යවස්ථාදායකය B - සදිවිහරිය C -දුනු අවරිය D - බොජකපති (ල. 1 x 4)
iii. දේශපාලන/ආර්ථික/ආගමික සේවාව අනුව විස්තරය (ල. 05 න් ලබා දෙන්න)
iv.* කාලසුමන වෙළඳපොල * අබලවපර වෙළෙන්දා * පුගය වෙළඳ සංවිධානය * බදුලු ටැම් ලිපිය * විදේශ වෙළඳුන් මෙරට ක්‍රියාත්මක වීම....(විස්තරය අනුව ල. 06 න් ලබා දෙන්න)

4. i. A - ඊජිප්තුව B - මුල්ලේරියා C - ජොරිස් වැන් ස්පිල්බර්ජන් (ල. 1 x 3)
ii. *වැදගත් නායකයන් සම්බන්ධ නඩු * කුමන්ත්‍රණ නඩු * කැරලි කෝලාහල පිළිබඳ නඩු *රාජද්‍රෝහිත්වය පිළිබඳ නඩු * විහාර හා භික්ෂූන් සම්බන්ධ නඩු (ල. 1 x 4)
iii. වැව් බැම්ම/රළපනාව/සොරොව්ව/බිසෝකොටුව/පිටවාන
ඉහත අංග දෙකක් විස්තරයට (ල. 05 න් ලබා දෙන්න)
iv. * වී ගොවිතැන/හේන් වගාව/ගෙවතු වගාව/සත්ව පාලනය
* කර්මාන්ත........විස්තරය අනුව (ල. 06 න් ලබා දෙන්න)

5. i. ජෝන් පයිබස්, හියු බොයිඩ්, රොබට් ඇන්ඩෘස් (ල. 1 x 3)
ii. A - ජහාන්ගීර් B - හජ්ජිමරික්කාර් C - මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි D - ෆෙඩ්රික් නෝර්ත් (ල. 1 x 4)
iii. A - ගොංගාලේගොඩ බණ්ඩා, පුරන් අප්පු, හඟුරන්කෙත ඩිංගිරාල, කඩහපොල හිමි, දිනෙස් අප්පුහාමි....
B - * රජයේ ඉඩම් ප්‍රතිපත්තිය * ගම් සභාව අඩපණ වීම * නව අධිකරණ ක්‍රමය * රජය හා මහජනතාව අතර සබඳතාව දුරස් වීම * රජයේ නව බදු ප්‍රතිපත්තිය (A - 1 x 2 B - විස්තර කිරීමට ල. 03 යි.)
iv. A - මුද්‍රණාල/පාසල්/පුවත්පත්/පරිවර්තන/පෙලපොත් රචනා කිරීම
(විස්තරයට අනුව ල. 03 න්)
B - පාසල්/පුවත්පත්/ඉංග්‍රීසි හා අරාබි භාෂා/මද්රාසා පාසල්
(විස්තරයට අනුව ල. 03 න්)

6. i. A - ඩී.එස්. සේනානායක B - ඒ.ඊ. ගුණසිංහ C - එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක (ල. 1 x 3)
ii. A - පොන්නම්බලම් අරුණාචලම් B - වලිසිංහ හරිස්චන්ද්‍ර
C - ජේම්ස් ටේලර් D - ජේම්ස් පීරිස් (ල. 1 x 4)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

iii. * ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම
* උඩරට හා පහත රට ඒකාබද්ධ කිරීම
* දිවයින පළාත් පහකට බෙදීම
* අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
* රජයේ වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම
* නව නීති හා උසාවි ක්‍රමයක් හඳුන්වා දීම
* ඉංග්‍රීසි අධ්‍යාපනය දියුණු කිරීම

(ලක්ෂණ තුනට ල. 03 යි. විස්තරයට ල. 02)

iv. * ඉංග්‍රීසි භාෂාව මෙරට ව්‍යාප්තවීම
* ගමනාගමන/සන්නිවේදන/අධ්‍යාපන/සෞඛ්‍ය කටයුතු දියුණු වීම
* පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය * කාර්මික විප්ලවයේ බලපෑම ඇතිවීම
* අපනයන වැවිලිභෝග හඳුන්වා දීම

(කරුණු දෙකට ල. 02 විස්තරයට ල. 04 යි.)

7. i. * අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය * ද්විමණ්ඩල පාර්ලිමේන්තුව * අග්‍රාණ්ඩුකාරධූරය * අධිකරණ ක්‍රමය (ල. 1 x 3)

ii. A - ගල්ඔය B - ජේ.ආර්. ජයවර්ධන C - නඩේස අයියර් D - සී.ඩබ්.ඩබ්. කන්නන්ගර (ල. 1 x 4)

iii. * තෙත් කලාපයේ ඉහල යමින් පවතින ජනගහන තදබදය හා රැකියා හිඟය අඩු කිරීම
* රටේ ආහාර නිෂ්පාදනය වැඩි කිරීම
* වියළි කලාපයේ වැව් හා වාරිමාර්ග ප්‍රතිසංස්කරණය
* තෘප්තිමත් ගොවිපරපුරක් බිහි කිරීම

(අරමුණු තුනට ල. 03 යි. විස්තරයට ල. 02 යි.)

iv. * විධායක ජනාධිපති ක්‍රමය * මූලික අයිතිවාසිකම් * පාර්ලිමේන්තුව * ඡන්ද විමසීම් ක්‍රම * අධිකරණය

(ප්‍රධාන අංග විස්තර කිරීම අනුව ල. 06 න්.)

## III කොටස

8. i. A - ඇමරිකන් විප්ලවය B - ප්‍රංශ විප්ලවය C - රුසියන් විප්ලවය (ල. 1 x 3)

ii. A - ජෝර්ජ් වොෂිංටන් B - දාහතරවන ලුවී C - වර්සෙල්ස් D - රුසියාව (ල. 1 x 4)

iii. *රජු හා රජ පවුලේ සුඛෝපභෝගී ජීවිතයට වැය වූ අධික වියදම * අනවශ්‍ය යුධ වියදම් * අසාධාරණ බදු ක්‍රමය (හේතු දෙකට ල. 02 යි. විස්තරයට ල. 03 යි.)

iv. * සමාජවාදී රාජ්‍ය බිහිවීම * පෞද්ගලික ඉඩම් අයිතිය අහෝසි කිරීම * සමූහ ගොවිපල ක්‍රමය * කර්මාන්ත/බැංකු/ගමනාගමනය ජනසතු කිරීම * නිෂ්පාදන ඵල සියලු දෙනාටම බෙදීයාම......

(ලියා ඇති විස්තරයට අනුව ල. 06 න් දෙන්න)

9. i. ෆැරැන්ක්ලින් රූස්වෙල්ට්/වින්ස්ටන් චර්චිල්/ජෝසප් ස්ටාලින් (ල. 1 x 3)

ii. මිත්‍ර පිල :- ප්‍රංශය,ඇ.එ. ජනපදය,රුසියාව,බ්‍රිතාන්‍ය
මධ්‍ය බලවතුන් :- ජර්මනිය,ඔස්ට්‍රියාව,තුර්කිය,බල්ගේරියාව..... (ල. 1 x 4)

iii. *ආර්ථික සම්බාධක පැනවීම * න්‍යෂ්ටික අවි තැනීම සීමා කිරීම හා පාලනය කිරීම * සාම සාධක හමුදාව යෙදවීම (ක්‍රියාමාර්ග තුනට ල. 03 යි. විස්තරයට ල. 02 යි.)

iv. * අක්ෂ පිල පරාජය කර මිත්‍ර පිල ජයගැනීම
* අතිවිශාල ජීවිත/දේපල/ධනය විනාශවීම, ලක්ෂ ගණනක් ආබාධිතයන් වීම
* නට්සි හමුදාව විසින් යුදෙව්වන් ලක්‍ෂ ගණනක් මරා දැමීම
* පරමාණු බෝම්බ හෙලීම නිසා අනාගත පරම්පරාව ද අවධානමකට ලක්වීම
* පරාජිත යුරෝපා රටවල් නගාසිටුවීමට මාෂල් සැලැස්ම
* ධනවාදී හා සමාජවාදී බල කඳවුරු බිහිවීම
* සීතල යුද්ධය........................ (විස්තර කිරීමට අනුව ල. 06 න් දෙන්න.)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources